# අන්තර්ජාලය සහ නූතන සන්නිවේදනය

**ධර්මානන්ද විජේසිංහ**

> කිසිම සන්නිවේදකයකුට එනම් තොරතුරු ලබා දෙන්නෙකුට නැතහොත් ජාලයේ පවතින යම් වෙබ් අඩවියකට කිසිදු " අධිකාරී බවක්" රඳවා ගත නොහැකිවීම අන්තර්ජාලයේ ස්වභාවයයි. ''වෙබ් අඩවි සිසාරා යන ග්‍රාහකයා සතුව සමස්ත අධිකාරී බලය රැඳී පවතී.'' ඔහුට තමන් කැමති ඕනෑම තැනක යන්නට පූර්ණ නිදහස ද පූර්ණ අයිතිය ද පූර්ණ හැකියාව ද ඇත

අන්තර්ජාල කටයුතු සංවර්ධන ඉංජිනේරුවකු වන ධර්මානන්ද විජේසිංහ විසින් ජාතික පුස්තකාල සේවා මණ්ඩලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්වූ දේශනයක් ඇසුරෙනි.

**අන්තර්ජාලය සමග සන්නිවේදනාත්මකව ගනුදෙනු කිරීමට සැපිරිය යුතු වන යම් යම් කරුණු කාරණා ගැන අපි පසුගිය කලාපයෙන් කියවූයෙමු.**

ජාල භාවිතයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණු තුනක් ලෙස අප සැලකුවේ,

1 . ජාලය තුළට පියමං කිරීම

2. ජාලය තුළ රැඳී සිටීම

3. ජාලය තුළ හිස එසවීම යන කරුණු යි.

දේශීය ජාල ක්‍රියාකාරකම් කවර තලයක පවතී ද, ඒවා කවර තරමේ ශක්තිමත් හෝ දුර්වල හෝ ආස්ථානයක පවතී ද යන්න සොයා බැලීමට මේ කරුණු තුන ඔස්සේ විමසුම් කළ යුතු වෙයි.

ජාලය තුළට පියමං කිරීම ක්‍රම දෙකකින් කළ හැකි බව අපි සාකච්ඡා කළෙමු.

1. පෞද්ගලිකව Individual users

2. ආයතනික Institutionally

ජාලය තුළට පියමං කිරීම සම්බන්ධයෙන් තවත් ආකාරයක වර්ගීකරණයක් විස්තර කෙරිණ.

1. තොරතුරු අවශ්‍යතාවන් උදෙසා End user කෙනෙකු ලෙස

2. තොරතුරු අඩවියක් ජාලය තුළ බිහි කොට එහි ස්ථානගතවීම

එම ආකාර දෙක ලෙස හැඳින්විණි.

ජාලය තුළ රැඳී සිටීම සහ ජාලය තුළ හිස එසවීම යන දෙකරුණු ගැන සැලකිය හැක්කේ, මෙම දෙවනුව සඳහන් කළ ආකාරයට ජාලය තුළට පියමං කළ විට ය.

එනම් තොරතුරු අඩවියක් බිහිකොට ජාලය තුළ ස්ථානගතවූ කවරකු හෝ කවර ආයතනයක් හෝ වේද ඔහු ජාලය තුළ කෙසේ රැඳී සිටියි ද? එය අනෙකුත් වෙබ් අඩවීන් අභිභවා වඩාත් ජනප්‍රිය, වඩාත් වැඩි පිරිසක් පැමිණෙන, වෙබ් අඩවියක් ලෙසට හිස ඔසවන්නේ කෙසේ ද? යන අංශ ඔස්සේ අපගේ අධ්‍යයනය මෙහෙයවිය හැකිවන්නේ එවිට ය.

## ජාලය තුළ රැඳී සිටීම

ජාලය තුළ තරගකාරීව රැඳී සිටීම එතරම් පහසු කටයුත්තක් නොවේ. අන්තර්ජාලය තුළ වෙබ් අඩවීන් දසදහස් ගණනින්, ලක්ෂ ගණනින් ඇති අතර ඒ සියළු වෙබ් අඩවීන් පවත්වාගෙන යන අය විසින් තම වෙබ් අඩවිය සාර්ථක එකක් බවට පත් කරන්නට බොහෝ වෙහෙස දරති. නිරන්තරයෙන් ම වෙහෙස දරමින් සිටිති.

ජාලය තුළ ජනප්‍රිය ලෙසින් රැඳෙන්නට නම් දෙයාකාර දැනුම් සම්භාරයක් අප විසින් එකතු කර ගත යුතු වෙයි.

එනම් " ජාල මාධ්‍ය" දැනුම (Web media knowledge) සහ "ජාල තාක්ෂණ" දැනුම (Web technical knowedge) වේ.

ජාලයේ මාධ්‍ය කටයුතු අනෙකුත් සන්නිවේදන මාධ්‍ය කටයුතුවලට වඩා වෙනස් මුහුණුවරක් ගනී. මුද්‍රිත මාධ්‍යයේදී "මුද්‍රිත ඉඩ ප්‍රමාණය" (space) සීමාසහිත වෙයි. මුද්‍රිත කටයුතුවලදී තමනට ලැබෙන පිටුවේ ඉඩකඩ තුළ සියළු තොරතුරු ගොනුකොට ඉදිරිපත් කිරීමට මාධ්‍යකරුවා වගබලා ගත යුතු වෙයි.

විද්‍යුත් මාධ්‍යයන්හිදී එනම් ගුවන්විදුලියේ හා රූපවාහිනියේ දී සීමාසහිත වන්නේ "ගුවන් කාලය යි." ගුවන් කාලය සමග හරඹ කරමින්, තම ;තාරතුරු 'නිර්මාණශීලීව ශ්‍රාවකයා/ග්‍රාහකයා ඇද බැඳ තබා ගනිමින්, ඉදිරිපත් කිරීමට විද්‍යුත් මාධ්‍ය මෙහෙයවන්නා සමත් විය යුතු වෙයි.

අන්තර්ජාලයේදී ද සීමාකාරී සාධකය වන්නේ කාලය යි. මෙහිදී එය "සිසාරා යන කාලය" (Browsing time) ලෙස හැඳින් වේ.

අන්තර්ජාලය සමග බද්ධ වී තොරතුරු ලබා ගැනීමට නම් ජාල සේවා සපයන්නකුගෙන් (Internet Service Provider) ජාල සබඳතාවක් ලබා ගත යුතු අතර දුරකථන මාර්ගයක් ඔස්සේ අපට සරල සම්බන්ධතාවක් ලබා ගත හැකි වෙයි. (dial-up cinnection)

එසේ ලබා ගන්නා සබඳතාවයකදී අප අන්තර්ජාලය සමග බද්ධ වී සිටින කාලයට එනම් ජාලය සිසාරා යන කාලයට යම් මුදලක්, ජාල සේවා සපයන්නා අයකරන අතර, දුරකථන සබඳතාවට ගතවූ එම කාලයට ම අදාළ දුරකථන ගාස්තුව ද අප විසින් ගෙවිය යුතු වෙයි.

මෙසේ දෙයාකාර ගාස්තුවක් අපට වියදම් වන අතර මෙම වියදම, අප ජලය සිසාර යන කාලයට ඍජුව ම සමානුපාතික වෙයි. එනිසා අප ජාලය සිසාරා යාමේදී "කාලය" ප්‍රධාන "පිරිවැය සාධකය" වෙයි.

### Time is the main Cost factor

වෙබ් අඩවියක් පවත්වා ගෙන යාමට උත්සාහ දරන කවරකු විසින් හෝ මේ යථාර්ථය සිත්හි දරා ගත යුතු වෙයි. මේ ගැන සැලකිල්ලක් නොදක්වන කවර හෝ වෙබ් අඩවියක් වෙතොත් එයට අන්තර්ජාල ග්‍රාහකයින්ගේ ජනප්‍රියතාවය දිනා ගැනීම ඉතාම අසීරු කරුණක් වෙයි.

වෙබ් පිටුවක් බාගත (Down Load) කිරීමට අධික වේලාවක් ගත වෙතොත් මුදල් වියදම් කරමින් එලෙස සෙමෙන් සෙමෙන් බාගත වීම බලා සිටින්නට කැමති වන්නේ කවුද? ඊළඟ වෙබ් පිටුවට නැතහොත් ඊළඟ වෙබ් පිටුවට ආදී වශයෙන් ක්ෂණික බාගත වීමක් (Quick Download) සොයා බලන ග්‍රාහකයා තමනට අවශ්‍ය ප්‍රතිචාරය එම වෙබ් අඩවියෙන් නොලැබෙන බව තේරුණහොත් සැනින් එය අතහැර වෙන වෙබ් අඩවියක් කරා පිය නගයි.

අන්තර්ජාලයේ ස්වභාවය එය යි. කිසිම සන්නිවේදකයකුට එනම් තොරතුරු ලබා දෙන්නෙකුට, නැතහොත් ජාලයේ පවතින යම් වෙබ් අඩවියකට කිසිදු **"අධිකාරී බවක්"** රඳවා ගත නොහැකි වෙයි. **"වෙබ් අඩවි සිසාරා යන ග්‍රාහකයා සතුව සමස්ත අධිකාරී බලය රැඳී පවතී."** ඔහුට තමන් කැමති ඕනෑම තැනක යන්නට පූර්ණ නිදහස ද පූර්ණ අයිතිය ද පූර්ණ හැකියාව ද ඇත.

එනිසා මාධ්‍යකරුවාට තමන්ගේ නොයෙකුත් බල පුළුවන්කාරකම් අසීමිත අනන්‍යතාවන්, අහංකාරයන් පවත්වා ගත නොහැකි වෙයි. ග්‍රාහකයා තමන් වෙත අද්දවා ගන්නට නම් ඔහුට ඉතාමත් නිහතමානී බවක් ප්‍රදර්ශනය කළ යුතු වෙයි. අනෙකුත් සියළු මාධ්‍යයන්ට වඩා අන්තර්ජාලයේ ඇති සුවිශේෂී තත්ත්වය මෙයයි.

මේ ස්වභාවය මැනවින් අවබෝධ නොකොට ගන්නා තාක් ජාලය තුළ තරඟකාරීව රැඳී සිටීම ඉතාමත් අපහසු කරුණක් වෙයි.

ඕනෑම පුවතක සාර සංක්ෂේපය ඉදිරිපත් කිරීම, අන්තර්ජාතික වශයෙන් උනන්දුවක් දක්වන කාරණා පමණක් තෝරා ගැනීම, නිතර නිතර වෙබ් අඩවියේ පවතින තොරතුරු අලුත් කිරීම (Live Updates) ආදිය ජාල මාධ්‍යමය වශයෙන් සැලකිල්ලට ගත යුතු කරුණු වන අතර, ජාල මාධ්‍යකරුවා web journalist එක රටකට කොටුවූ චින්තනයක් සහිත පුද්ගලයකු නොවී, අන්තර්ජාතික වශයෙන් සිතන්නට හැකි, පුළුල් දැනුමින් යුතු නිදහස් මතධාරී, පුද්ගලයකුවීම අනිවාර්ය සාධකයක් වෙයි.

එවිට පමණි වෙබ් අඩවියක අඩංගු කරුණු කාරණා විචිත්‍රවත් ලෙස මෙන්ම ග්‍රාහකයා රඳවා ගැනීමට හැකිවන අයුරින් සකසන්නට හැකි වනුයේ.

## ජාල තාක්ෂණ දැනුම

මෙය මාධ්‍යමය පාර්ශ්වය සේම ඉතාමත් වැදගත් අංශයකි. ජාල තාක්ෂණය එක තැන පල්වන්නක් නොවේ. ඉතාමත් වේගයෙන්, ඉතාමත් ශූර ලෙස, දිනෙන් දින සිදු වන බොහෝ ප්‍රගමනකාරී වෙනස්කම් ජාල තාක්ෂණය සතු වෙයි. එනිසා වෙබ් අඩවියක් පවත්වාගෙන යන වෙබ් නිර්මාණකරුවකු (web designer) ජාලය තුළ සිදුවන්නාවූ තාක්ෂණික වෙනස්කම් ගැන නිරන්තරව අවදියෙන් සිටිය යුතු වෙයි.

මෙය එතරම් පහසු කාර්යයක් නොවේ. මන්දයත් අන්තර්ජාල තාක්ෂණයේ හා එහි ක්‍රියාකාරකම්වල අති ධාවනකාරී වර්ධනය, අපට ඒ පසුපස හඹා යා නොහැකි තරමට වේගවත් බැවිනි. මෙය විශ්වාස කළ නොහැකි තරමේ අපූර්ව තත්ත්වයකි. ඊයේ මුළු දවස වැයකොට ජාල තාක්ෂණ පරිච්ඡේදයක් ඉගෙන, අද සිත් ප්‍රබෝධයෙන් යුතුව ඊට අදාළ ක්‍රියාකාරකම් කරන්නට සැරසෙන විට, එම තාක්ෂණය යල් පැන ගොස් ය. එහි තාක්ෂණයේ නව්‍ය ස්වරූපයක් (new version) අද අප අබියස අභිමානයෙන් බලා සිටී.

මෙම වේගවත් වර්ධනය හමුවේ අපට, කළ හැක්කේ කුමක් ද? අපට පමණක් නොව අන්තර්ජාලය ඇසුරු කරන ලෝකවාසී කවරකු වුවද කළ යුත්තේ අතිමහත් වූ ජවයකින් මෙම තාක්ෂණ සෙන්ධවයා හඹා යාම පමණි.

අප වැනි තුන්වන ලෝකයේ රටක පාදක ව්‍යුහයන් එවැනි හඹා යැමකට ඔරොත්තු දෙන අන්දමට වර්ධනය වී ඇත්ද යන්න සැක සහිත ය.

මෙහ අද දවසේ අප මුහුණ දෙන ප්‍රධාන ගැටළුවලින් එකකි. පසුගිය හත් වසර පුරා ලාංකීය ජාල ක්‍රියාකාරකම් යම් පසුගාමී තත්ත්වයක පවතින්නට මෙය ප්‍රධාන හේතුවක් වී ඇත.

එහෙත් වඩාත් ම බලපා ඇති තවත් ප්‍රධාන හේතුවක්ද වෙයි..

"ජාල මාධ්‍යමය", පාර්ශ්වය සහ "ජාල තාක්ෂණ" පාර්ශ්වය අතර මනා සන්නිවේදනයක් නැති වීම මෙම පසුබෑමට බලපාන ප්‍රධාන ම කාරණය යි.

ජාලයට පිය මනින ලද මාධ්‍යකරුවන් අප රට තුළ ඇත්තේ අල්ප ප්‍රමාණයකි. ජාල ක්‍රියාකාරකම් තවමත් වඩා වැඩි වශයෙන් රඳ පවතින්නේ ජාල තාක්ෂණයන්ගේ (web technicians) අතෙහි ය.

ඔවුන් විසින් තමන් පරිහරණය කරන ජාල තාක්ෂණය, ජාල පහසුකම්, ජාල තාක්ෂණ විධික්‍රම මාධ්‍යකරුවන් අතට නිසියාකාරව පත් නොකිරීම නිසා අන්තර්ජාල ක්‍රියාකාරකම් තටු කපා දමා ඇති තත්ත්වයකට පත්ව තිබේ.

අන්තර්ජාලය තුළ තාක්ෂණඥයන්ට යා හැකි දුර සාපේක්ෂක වශයෙන් ඉතාමත් සීමිත වෙයි. සැබෑ ලෙසින් ම ජාලය තුළ හරඹ කළ යුත්තේ, ශිල්ප විද්‍යා දක්විය යුත්තේ ජාල මාධ්‍යකරුවායි. එහෙත් අද දවසේ ජාල මාධ්‍යකරුවා, ජාල තාක්ෂණඥයන්ගේ අතයට සැරිසරන පුංචකු බවට පත් වීම නිසා සමස්ත ලාංකීය ජාල ක්‍රියාකාරකම් ඉතාමත් දුක්ඛිත ලෙසින් දුර්වල මට්ටමක පවතී.

තාක්ෂණ අධිකාරිය විසින් ජාල මාධ්‍ය කටයුතු යටපත් කරගෙන සිටින තාක් කල් ජාල ක්‍රියාකාරකම්වල කිසිදු ප්‍රවර්ධනකාරී අනාගතයක් අපට දැකිය හැකි නොවෙයි. මේ තත්ත්වය වෙනස් කිරීමේ වගකීම සම්පූර්ණයෙන් ම ඇත්තේ ජාල මාධ්‍යකරුවා (web journalist) අතෙහි ය.

මේ අනවශ්‍ය අධිකාරීන් අභිභවා ගොස් තමනට ජාලය තුළ හිමි ස්ථානය සාක්ෂාත් කර ගන්නට ජාල මාධ්‍යකරුවා සමත් වන්නේ කවදා ද, එදින ලාංකීය ජාල ක්‍රියාකාරකම්වල වර්ධනීය නව පිටුවක් පෙරළෙන දිනය බවට සනිටුහන් කළ හැකි වනු නොඅනුමාන ය. ❑

